# සත්සතිය ක්‍රමයෙන් සංවර්ධනය වූවක්ද?

ගල්පොත්තාවල අමිත හිමි

සුද්ධෝදන මහරජතුමාගේ හා මහාමායා දේවියගේ එකම අත්ජාත පුත්‍රයා සිදුහත් කුමාරයා ය. කිඹුල්වත් නුවර උපත ලද මෙම කුමරා ක්‍රමයෙන් තුරුණු වියට පැමිණ යශෝධරා කුමරිය සරණපාවා ගෙන සෘතුත්‍රයට සරිලන ප්‍රාසාද තුනක වසමින් මිනිසකු විසින් විඳියයුතු උසස්ම සම්පත් වින්දේය. එහෙත් සතර පෙර නිමිති දැකීමෙන් සසර කලකිරී සියලුම සම්පත් උදැසන හෙළන ලද කෙළපිඩක් සේ සලකා අතහැර දමා ඇසළ පුණු පොහෝදින අභිනිෂ්ක්‍රමණම කළේය. එදින සිට කිං සත්‍ය ගවේෂීව වාසය කරමින් වර්ෂ හයක්ම සිරුරට දියයුතු දුක් වේදනා දෙමින් වාසය කළේය. එහිද දෙස් දුටු සිදුහත් තවුසාණන් එයද දුරුකොට මැදුම් පිළිවෙත අනුගමනය කරමින් සුජාතාව විසින් පිරිනමන ලද කිරිබත වළඳා බෝධිමූලයෙහි වාඩිවූයේ තමාගේ උතුම් අභිප්‍රාය ඉටුකරගෙන මිස නො නැගිටින මහඟු අධිෂ්ඨානයෙනි. එදින වෙසක් පුණු පොහෝද දසමරුන් පරදවා බුද්ධ රාජ්‍යයට පත්වූයේ තම අධිෂ්ඨානය පරිදිමය.

කළගුණ දන්නාවූ අප භාග්‍යවතුන් වහන්සේ සත් සතියක්ම බුද්ධ රාජ්‍යයට පත්වීමට උපකාර වූ බෝධිය අසල වාසය කළ සේක. බෝධිමූලයෙහිම සතියක්ම වාසය කළහ. මෙහිදී දෙවියන්ගේ සැක දුරුකිරිම සඳහා යමක මහා ප්‍රාතිහාර්යයද පෑහ. ඊලඟ සතිය බෝරුකට මදක් නුදුරින් ඊසානදිග සිටගෙන ඇසිපිය නොහෙළා බෝරුක දෙස බලාගත් නෙතින්ම සිටියහ. අනතුරුව රුවන් සක්මන මවා ගෙන එහි පුරා සතියක් සක්මන් කළහ. සතරවන සතිය දෙවියන් විසින් මවනලද රුවන්ගෙයි වැඩ වසමින් අභිධර්ම පිටකයෙහි අති ගාම්භිර වූ පට්ඨානය මෙනෙහි කළහ. පස්වන සතිය අජපාල නුගරුක මුල විමුක්ති සුඛයෙන් වැඩ වාසය කළහ. මෙහිදී හුහුංක බමුණා මුණගැසීම සිදුවිය. තමාට ගුරුවරයකු සෙවීමද මෙහිදී සිදුවූයෙන් ධර්මය තමාගේ ගුරුවරයා කොට සැලකීම වැදගත් බවද ප්‍රත්‍යක්ෂ කරගත්හ. මාරයා විසින් පිරිනිවීම සඳහා ප්‍රථම ආරාධනාව ද මෙහිදී කරන ලදී. සයවන සතිය මුචලින්ද නුගරුක මුල වැඩ සිටියහ. සත්වන සතිය රාජායතනයෙහි වැඩසිටි අතර තපස්සු භල්ලුක වෙළඳුන් මුණගැසිණ. ඉනික්බිතිව වර්ෂ 45 ක් මුළුල්ලේ ලෝවැසියන් කෙරේ මහත් කරුණාවෙන් දහම් දෙසමින් සසර කතරින් එතරකළ එම භාග්‍යවතුන් වහන්සේ කුසිනාරා නුවර මල්ලව දරුවන්ගේ සල්උයනේදී පිරිනිවන් පා වදාළ සේක.

මෙහිදී ප්‍රකාශ කරන ලද්දේ බුද්ධ චරිතය කෙටියෙනි. මෙහිදී විශේෂයෙන්ම සාකච්ඡාවට භාජනය කරන්න බලාපොරොත්තු වන්නේ සත් සතිය පිළිබඳවයි. සාමාන්‍ය ලෙස බුදු සිරිත දෙස බලනවිට සත් සතියක්ම බුදුරජාණන් වහන්සේ ගත කළ බව දක්නට ලැබේ. නමුත් පෙළ පොත්වලින් බුද්ධ භාෂිත ලෙසින්ම සූත්‍ර ඇසුරින් සත් සතියක් දැක්වීම අසීරු කරුණකි. මෙතැන් සිට අප ඒ ගැන අවධානය යොමු කරමු.

ප්‍රථම සතිය:-

"තෙන ඛො පන සමයෙන බුද්ධො භගවා උරුවෙලායං විහරති නජ්ජා නෙරඤ්ජරා තීරෙ බොධිරුක්ඛමූලේ සත්තාහං එක පල්ලමුකෙන නිසිදි. විමුක්ති සුඛ පටිසංවේදී" මෙයින් ප්‍රථම සතිය බෝධි වෘක්ෂ මූලයෙහි විමුක්ති සුඛයෙන් කල්ගත්කළ බව දැක්වේ.

පස්වන සතිය:-

"අථ ඛො භගවා සත්තාහස්ස අච්චයෙන තම්හා සමාධිම්හා වුට්ඨහිත්වා බොධිරුක්ඛමූලා යෙන අජපාල නිග්‍රොධො තෙනුපසඞ්කමි උපසඞ්කමිත්වා අජපාල නිග්‍රොධ මූලෙ සත්තාහං එකපල්ලඞ්කෙන නිසිදි. විමුක්ති සුඛ පටිසංවේදී."[1] සත් සතියක් බෝධි මූලයෙහි ගත කළ බුදුහු ඊලඟට අජපාල නුගරුක මුල සත් දවසක් ගතකළ බව දක්වෙයි. දැනට සාමාන්‍ය පිළිගැනීම අනුව මෙය පස්වන සතිය ලෙස පිළිගැනේ.

සයවන සතිය:-

"අථ ඛො භගවා සත්තාහස්ස අච්චයෙන තම්හා සමාධිම්හා වුට්ඨහිත්වා අජපාල නිග්‍රොධ මූලායෙන මුචලින්ද තෙනුපසඞ්කමි උපසඞ්කමිත්වා සත්තාහං එකපල්ලඞ්ඛෙන නිසිදි. විමුක්ති සුඛපටිසංවේදී."[1] මෙයින් තුන්වෙනි සතිය මුචලින්ද නාගදරනින් ආරක්ෂාව ලබමින් සතියක් ගත කළ බව සැලකේ. මෙයද දැනට පිළිගැනීම අනුව සවන සතිය ලෙස සැලකෙයි.

සත් වන සතිය:-

අථ ඛො භගවා සත්තාහස්ස අච්චයෙන........ යෙන රාජායතනං තෙනුපසඞ්කමි.......... පීතිසුඛ පටිසංවේදී. මෙයින් සතර වන රාජායතනයෙහි ගතකළ බව දක්වෙතත් දැනට මේ සතිය සත් වැනි සතිය ලෙස පිළිගැනේ.

මේ අයුරින් මහා වග්ගපාලියෙහි දැනට සාමාන්‍ය සැලකීම අනුව පළමුවන, පස්වන, සවන, සත්වන යන සති හතරක් පමණක් දැකගත හැකිය. දෙවන තුන්වන සතරවන සති එහි දක්නට නොමැත. මේ පිළිබඳ සෙවීමේදී මහාවග්ගපාලිය වැදගත් වූවාක් මෙන්ම උදාන පාලියද අතිශය උපකාර වේ. එහිදී දක්නට ලැබෙන්නේ ද සති තුනකි. ඒ මෙසේ ය:

''එවං මෙසුතං එකං සමයං භගවා උරුවෙලායං විහරති නජ්ජා වෙරඤ්ජාය තීරෙ බොධිරුක්ඛ මූලෙ පඨමාභි සම්බුද්ධො තෙනබොපන සමයෙන භගවා සත්තාහං එක පල්ලඞ්කෙන නිසින්නො හොති. විමුක්ති සුඛ පටිසංවේදී.''[2] මෙයින් ප්‍රථම සතිය පිළිබඳවැ කියවේ.

''එවං මෙ සුතං එකං සමයං භගවා උරුවෙලායං විහරති....... අජපාල නිග්‍රොධ මූලෙ සත්තාහං එක පල්ලඞ්කෙන නිසින්නො හොති විමුක්ති සුඛ පටිසංවේදී''[2] මෙයින් අජපාල නුගරුක මුල වාසය කිරීම දැක්වේ.

''එවං මෙ සුතං එකං සමයං භගවා මුචලින්ද මූලෙ පඨමාභි සම්බුද්ධො ....... . සත්තාහං එක පල්ලඞ්කෙන නිසින්නො හොති විමුක්ති සුඛ පටිසංවේදී''[2] මෙයින් සත් දවසක් මුචලින්ද මූලයෙහි වාසය කළ බව දැක්වේ.

මේ ආකාරයට උදාන පාලියෙහි ඉතා පැහැදිලි ලෙස සති තුනක් හෙවත් දිනට අපගේ පිළිගැනීමට අනුව ප්‍රථම, පස්වන, සවන යන සති තුන පමණක් දැකගත හැකිය. එසේම පඨම බොධි සුත්ත, දුතිය බොධි සුත්ත, තතිය බොධි සුත්ත යනුවෙන් සූත්‍ර තුනක් ද මේ සමගම උදානයෙහි දක්නට ඇතත් එයින් සති තුනක් ගත යුතු ද යන්න සිතා ගැනීමට නොහැකිය. කෙසේවෙතත් මෙහි මහාවග්ගපාලි- යෙහි දක්නට ලැබෙන රාජායතනයක් සඳහන්ව නොමැත. මේ අනුව උදානය පාලිය මහාවග්ග පාලිය යන ග්‍රන්ථ අනුව (පෙළ පොත්වලින්) සත් සතියක් සෙව්වද අපට සොයා ගතහැක්කේ සති හතරක් ම ය. සති තුනක අඩුවක් මෙහි තිබේ.

මෙම සති තුන පිළිබඳ පරීක්ෂණයක් අප විසින් පැවැත්විය යුතුය. එම සති තුනෙහි අඩුලුහුඩු බව පිරවීමට අටුවා ග්‍රන්ථවල පිටුවහල අපට ඉතාම ප්‍රයෝජනවත්ය. විශේෂයෙන්ම ජාතක අටුවාව මෙයට ඉතාම පිටුවහලකි.

අථ බො භගවා සත්තාහං එක පල්ලඞ්කෙන නිසිදි විමුක්ති සුඛ පටිසංවේදී අථෙකච්චානං දෙවතානං අජ්ජා'පි නූන සිද්ධත්ථස්ස කත්තබ්බ කිච්චං අත්ථි පල්ලඞ්කසමිංහි ආලයං න විජහති'ති පරිවිතක්කො උදපාදි'' මේ ජාතක අටුවාවෙහි ප්‍රථම සතිය පිළිබඳ දක්වන ආකාරයයි. ''......පල්ලඞ්කෙන ඊසකං පාචීන නිස්සිතෙ උත්තර දිසාභාගෙ ඨත්වා....'' ආදී වශයෙන් දෙවන සතිය පිළිබඳව දැක්වේ.

''අථ පල්ලඞ්කස්සච ඨිතට්ඨානස්සච අන්තරා චඞ්කමං මාපෙත්වා පුරත්ථිම පච්ඡිමතො............ රතන චඞ්කමෙ චඞ්කමන්තො සත්තාහං වීතිනා මෙසි.......... පච්ඡිමුත්තර දිසාභාගෙ දෙවතා රතනඝරං මාපයිංසු තත්ථ පල්ලඞ්කෙන නිසීදිත්වා අභිධම්මපිඨකං......... සත්තාහං වීතිනාමසි......... පච්ඡමෙ සත්තාහෙ බොධිරුක්ඛමූලා යෙන අජපාල නිග්‍රොධො තෙනුපසංකමි..........''

මේ ආකාරයට ජාතක අටුවාවෙහි සත් සතිය ඉතා පැහැදිලි ලෙස විදහා දක්වා ඇත. එසේම මෙම සත් සති ගතකළ තැන්වලට චෛතිය යන නම ව්‍යවහාර කළ බව අටුවාව තුලින් දැකගතහැකිය.

තවද ''දෙවන සතිය ගත කළ තැන අනිමිස චෛතිය ඇතිවූ බව ජාතක අටුවා නිදානයේ හා බුද්ධවංශ අට්ඨකථාවේ දැක්වේ. පාහියන් ද හියුංෂාන් ද මේ චෛතිය ගැන දක්වා ඇත. අනිමිස ලෝචන පූජාව ගැන බුරුම ග්‍රන්ථයන්හිවත් තිබ්බතීය වාර්තාවන්හිවත් සඳහන්ව නැත. මේ ගැන බුද්ධ වංශ අටුවාවෙහිද ලලිත විස්තරයෙහිද විස්තර වේ. ලලිත විස්තරයේ බුදුරජාණන් වහන්සේ පළමු සතිය බෝරුක මුලද දෙවන සතිය රුවන් සක්මනෙහිද ගත කළ බව කියවෙන අතර තුන්වන සතිය අනිමිස ලෝචන පූජාව කළ බව දැක්වේ.''

එමෙන්ම ''තුන්වන සතිය රුවන් සක්මනෙහි ගතකළ බවත් එය චඞ්කම චෛතිය වූ බවත් හියුංසාංගේ හා පාහියන්ගේ වාර්තාවල දැක්වේ.'' සතරවන සතිය දෙවියන් විසින් මවන ලද රතනඝරයෙහි අභිධර්මයෙහි පට්ඨානය මෙනෙහි කළ බව අටුවාවේ සඳහන් වේ. මෙහි රුවන් ගෙයක් නොතිබුන බවත් සප්තප්‍රකරණයන් සම්මර්ෂණය කළ හෙයින් රතනඝර වූ බවත් ආභිධම්මිකයෝ කියති. එහෙත් මෙහි ගෙයක් තිබුනේ යැයි සැලකිය යුතු බව ජාතක අටුවාව කියයි. මෙවැනි විස්තරයක් බුද්ධවංස අටුවාවෙහි දක්නට නැතත් පාහියන් හා හියුංෂාංගේ වාර්තාවල මෙහි කතන ලද ස්ථූපයක් පිළිබඳව ද දැක්වේ.

මේ ආකාරයට විකාශනයට පත්වූ සත් සතිය පිළිබඳ සංකල්පය දියුණුවට පත්වීමෙන් අනතුරුව එය වන්දනා කිරීම සඳහා

''පඨමං බොධි පල්ලඞ්කං දුතියඤ්ච අනිම්මිසං
තතියං චඞ්කමනං සෙට්ඨං චතුත්ථං රතනාඝරං
පඤ්චමං අජපාලඤ්ච මුචලින්දෙන ඡට්ඨමං

සත්තමං රාජායතනං වන්දෙතං මුනි සෙවිතං''*

මේ වැනි ගාථා බන්දනයන් ද සිදුකර ඇති බව පැහැදිලි කරුණකි.

ඉහත සඳහන් කරන ලද කරුණු දෙස බලනවිට ත්‍රිපිටක පාලියෙහි සත්සතියෙන් සති හතරක් පමණක් දක්නට ලැබෙන බවත් අටුවා යුගයේදී හා අනතුරුව දේශ දේශාන්තරවල බුදු දහම පැතිරි යනවිට සත් සතියේ අඩුලුහුඩුකම් (ත්‍රිපිටකයෙන් සොයා ගත නොහැකි) දෙස දක්නට ලැබෙන සති තුන සම්පූර්ණ වීමෙන් සත් සතිය සම්පූර්ණත්වයට පත්වූ බවත් සඳහන් කළ හැකිය. මේ අනුව සත් සතිය ක්‍රමික සංවර්ධනයක ප්‍රතිඵලයක් ලෙස ප්‍රකාශ කිරීම අවිවාදයෙන් පිළිගත හැකි සත්‍යයක් බව එකහෙලාම සඳහන් කළ හැකිය.

### ආශ්‍රිත ග්‍රන්ථ


1. මහාවග්ග පාලි අභිසම්බොධි කථා
බුදු සිරිත:- කේ. ඩී. පී. වික්‍රමසිංහ
මහාවග්ගපාලිය
උදාන අට්ඨකතාව
අපදාන අට්ඨකතාව
ජාතක අට්ඨකථාව
ඛුද්දක නිකාය
සම්බුදු සිරිත:- කේ. ඩී. පී. වික්‍රමසිංහ
බෞද්ධ සංස්කෘතිය:- සිරි සොමිස්සර හිමි
*බුද්ධ ඇදහිල්ල